ඇමුණුම් අංක 01-I

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්‍ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්‍ෂණ සහායක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**

**සංශෝධන අංක - 03**

| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 10.1.1.1 | I. පත්වීම ස්ථිර කර තිබීම.<br>II. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.<br>III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.<br>VI. අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ නියමිත දිනට සමත්වී තිබීම. | 10.1.1.1 | I. පත්වීම ස්ථිර කර තිබීම<br>II. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.<br>III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>IV. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.<br>V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.<br>VI. අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ නියමිත දිනට සමත්වී තිබීම. | "පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම" වෙනුවට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි විධිවිධාන අනුව "විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය" යන අවශ්‍යතාවය ඇතුළත් කරමින් සංශෝධනය කිරීම.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023 - 04 - 25 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| 10.2.1.1 | **I.** සේවා ගණයේ **II** වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය **(10)**ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය **(10)**ක් උපයාගෙන තිබිම.<br>**II.** අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය **(10)**ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>**III.** උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>**IV.** අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ නියමිත දිනට සමත්වී තිබීම. | 10.2.1.1 | **I.** සේවා ගණයේ **II** වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය **(10)**ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය **(10)**ක් උපයාගෙන තිබිම.<br>**II.** අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය **(10)**ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>**III.** උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.<br>**IV.** අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ නියමිත දිනට සමත්වී තිබීම. | "පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම" වෙනුවට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි විධිවිධාන අනුව "විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය" යන අවශ්‍යතාවය ඇතුළත් කරමින් සංශෝධනය කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-04-25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

<table>
<tr>
<td>ඇමුණුම 02<br><br>5</td>
<td>විභාගය සඳහා වන විෂය නිර්දේශය<br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහ විධිවිධාන, කාර්යාල පරිචය හා කාර්යාල ක්‍රම පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>Vවන පරිච්ඡේදය-මුදාහැරීම්, නැවත සේවයට ගැනීම් සහ සේවය අවසන් කිරීම<br>VIIIවන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස්, නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>XIIවන පරිච්ඡේදය - නිවාඩු<br>XIIIවන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIVවන පරිච්ඡේදය - දිවයින තුල රාජකාරි ගමන්<br>XIXවන පරිච්ඡේදය - රජයේ නිවාස<br>XLVIIවන පරිච්ඡේදය- සාමාන්‍ය හැසිරීම හා විනය</td></tr>
</table>
</td>
<td>ඇමුණුම 02<br><br>5</td>
<td>විභාගය සඳහා වන විෂය නිර්දේශය<br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහ විධිවිධාන, කාර්යාල පරිචය හා කාර්යාල ක්‍රම පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>Vවන පරිච්ඡේදය-මුදාහැරීම්, නැවත සේවයට ගැනීම් සහ සේවය අවසන් කිරීම<br>VIIIවන පරිච්ඡේදය - අතිකාල දීමනා, නිවාඩු දවස්, නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>XIIවන පරිච්ඡේදය - නිවාඩු<br>XIIIවන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර<br>XIVවන පරිච්ඡේදය - දිවයින තුල රාජකාරි ගමන්<br>XIXවන පරිච්ඡේදය - රජයේ නිවාස<br>XLVIIවන පරිච්ඡේදය- සාමාන්‍ය හැසිරීම හා විනය</td></tr>
</table>
</td>
<td>රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මින් පෙර 2009.02.20 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති, අංක: 2310/29 හා 2022.12.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2023.01.01 දිනැති සිට අවලංගු කිරීම හා එදින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධිත කාර්ය පටිපාටික රීති බලාත්මක කිරීම අනුව මෙම පරිපාටිය සංශෝධනය කිරීම.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>2023-04-25 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම්</td>
</tr>
</table>

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : - නිර්දේශ කරමු.

1. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..................................

2. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..................................

3. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..................................

4. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..................................

5. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..................................

6. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..................................

7. පී.ටී.ජී.ගුණතිලක මහතා (සාමාජික) ..................................

දිනය 2023.04.04.

ආණ්ඩුකාර ලේකම්,

2023.04.04. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2023/478. යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධන අංක - 03" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2023.04.04.

..................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත
නිල මුද්‍රාව

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

2023-04-25

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත